
# බෝධි වන්දනාව



සම්පාදනය

පූජ්‍ය නාඋයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ

ධර්ම දානය

වෛද්‍යාචාරිනී පුෂ්පා ගුණරත්න මහත්මිය
ඩබ්. ඩී. මෙන්ඩිස් මයා
රම්‍යා ගුණරත්න මහත්මිය

$\frac{2552}{2009}$ අප්‍රේල් 24

# බෝධි වන්දනාව

සම්පාදනය

**පූජ්‍ය නාඋයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ**

2552/2009 අප්‍රේල් 24

# බෝධි වන්දනාව

පළමු මුද්‍රණය 1999
දෙවැනි මුද්‍රණය 2003
තෙවැනි මුද්‍රණය 2009

<u>ධර්ම දානය</u>

**වෛද්‍යාචාරිනී පුෂ්පා ගුණරත්න මහත්මිය**

**ඩබ්. ඩී. මෙන්ඩිස් මයා**

**රම්‍යා ගුණරත්න මහත්මිය**

$\frac{2552}{2009}$ අප්‍රේල් 24

# පුණ්‍යානුමෝදනාව

බෝධි වන්දනාව නැමති දහම් පොත කිප වතාවක්ම මුද්‍රණය කිරීම සතුටට කරුණකි. වන්දනා කිරීම සැම දෙනා විසින්ම ක්‍රමවත්ව කළ යුතුය. සද්ධාදි ගුණ වැඩෙන සේ ඉතා ගෞරවයෙන් කළ යුතු අතර, කර්මය සහ කර්ම ඵලය ඇදහිය යුතුය. විශ්වාස කටයුතුය. බෝධි පූජාව, බුද්ධ පූජාව තුලින් ලැබෙන කුසලය නිවන් දකිනා ජාති දක්වාම ඵල විපාක ලැබෙති. මනුෂ්‍ය සම්පත්තිය, දේව සම්පත්තිය, සක්විති සම්පත්තිය, ශක්‍ර සම්පත්තිය නිර්වාණ සම්පත්තිය යන උතුම් සම්පත් උදාවේ. එවැනි මහා සම්පත් ලැබෙන පරිදි පූජාව සිද්ධ කටයුතුයි.

මෙම බෝධි වන්දනාව නැමති දහම් පොත අතිපූජනීය මහා කම්මට්ඨානාචාර්ය ත්‍රිපිටකවේදි ධර්ම කථික හා ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රධාන අනුශාසක හා යෝගාශ්‍රමාධිපති අතිපූජනීය නාඋයනේ අරියධම්මාභිධාන මාහිමිපාණන් වහන්සේ විසින් සම්පාදනය කළහ. උන්වහන්සේට ධර්ම දානමය කුසල බලයෙන් ආයුරාරෝග්‍යාදි සැප විහරණ සැලසේවා ! සියලු පැතුම් සඵල වේවායි ආශිර්වාද කරමි. අපවත්වී වදාළ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා නිර්මාතෘ රාජකීය පණ්ඩිත මහෝපාධ්‍යාය අතිපූජනීය කඩවැද්දුව ශ්‍රී ජිනවංසාභිධාන නායක මාහිමිපාණන් වහන්සේට මේ කුසල් බලයෙන් උතුම් බුදු බව අත්වේවා ! අපවත්වී වදාළ කෝට්ටේ ශ්‍රී දේවානන්ද නායක ස්වාමීන් වහන්සේට මේ පින නිවන් සුව පිණිස හේතුවේවා !

පරලොව සැපත් වෛද්‍යාචාර්ය ඩී. ඩී. ඉසෙඩ්. ගුණරත්න මහතාට ද එම මහත්මියට ද, සුසිල් ගුණරත්න සහෝදර මහතාටද, කෞශල්‍යා බුද්ධිමනි දියණියට ද ඩබ්. ඩිඩ්න් මෙන්ඩිස් මහතාට ද තවත් පරලොව සැපත් මව්පිය ගුරුවර ඥාති මිත්‍ර සැමටද මේ කුසල සසර ගමන සුවපත් වීම පිණිස ද, නිවන් සුව පිණිස ද හේතුවේවා !

ධර්ම දානමය පිංකම හිමිකරගත් බොරලැස්ගමුව පදිංචි වෛද්‍යාචාරිනි පුෂ්පා ගුණරත්න මහත්මිය, ඩබ්. ඩී. මෙන්ඩිස් මහතා, රම්‍යා ගුණරත්න මහත්මිය, මිලින්ද, චරංසි යන දරු දෙපළට ද අසනීපයෙන් සිටින රානි ගුණරත්න මහත්මියට ද රංජිත් ගුණරත්න මහතාට ද රංසිරිනි මහත්මියට ද වයෝ වෘද්ධ මල්ලිකා මහත්මියට ද

මෙන්ඩිස් මැණියන්ට ද හේමා හඳුන්නෙත්ති, ඔල්ගා ගුණරත්න මහත්මිය සහ ලලිත් ගුණරත්න මහතාටද ගුරුවර ඥාතීන්ට ද අධ්‍යාපනය ලබාදුන් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ද පවුලේ සැමට ද ධර්ම දානමය කුසල බලයෙන් නිදුක් වේවා ! නිරෝගී වේවා ! සුවපත් වේවා ! සියලු පැතුම් සඵල වේවා ! සසර ගමන වාසනාවන්ත වේවා ! නිවන් සුව අත්වේවා යි පතමි.

පෙබරවාරි 22 උපන්දින සැමරූ එම්. යූ. ජයසේකර හිටපු විදුහල්පතිතුමාට නිදුක් නිරෝගී සුව හා දීර්ඝායුෂ ලැබේවායි පතමි.

දෙවියන් සහිත ලෝකවාසීන්ට ද සෙත ශාන්තිය යහපත සැලසේවා ! සක්වා මුද්‍රණාලයාධිපතිතුමා ප්‍රධාන කාර්ය මණ්ඩලයට නිරෝගී සුව ලැබේවා !

මෙයට,

කාරුණික,

**කහගොල්ලේ සෝමවංශ හිමි**

ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රමය
ගල්දූව ආරණ්‍ය සේනාසනය
ගල්දූව - කහව.
2009. 04. 20

# පෙරවදන

"බෝධි වුච්චති චතූ මග්ගේසු ඤාණං" බෝධි යනු සතර මාර්ග ඥානයයි. "අනුත්තරං සම්මා සම්බෝධිං අභිසම්බුද්ධො" බෝධි යනු සර්වඥතා ඥානයයි. "පත්වාන බෝධිං වරභූරි මේධසො" බෝධි යනු ශාන්ත නිර්වාණ ධාතුවයි. තවද බෝධි යනු සර්වඥරාජෝත්තමයන් වහන්සේට ද නමකි.

බුද්ධගයා ශුද්ධ භූමියෙහි අස්වත්ථ වෘක්ෂයට පිට දී තථාගතයන් වහන්සේ සතර මාර්ග ඥාන සතර ඵලඥාන බෝධියට ද, සර්වඥතා ඥාන බෝධියට ද ශාන්ත නිර්වාණ ධාතු බෝධියට ද සැපත් වූ බැවින් ඒ අස්වත්ථ වෘක්ෂ රාජයාණන් ද බෝධි නමින් හැඳින්වේ.

බුද්ධ ගයාවේ පිහිටි එම විජය ශ්‍රී බෝධිරාජයාණන්ගේ පුත්‍ර නතෘ පරම්පරාවට අයත් වූ සියලු බෝධි වෘක්ෂයෝ පාරිභෝගික වස්තු වශයෙන් පූජනීයයි. එසේ හෙයින් බෝධි පූජාව වෘක්ෂ පූජාවක් හෝ දේව පූජාවක් නොවේ. බෝධි පූජාව බුද්ධ පූජාවකි. ඥාන පූජාවකි. බුද්ධානුස්සති භාවනාවකි.

**යෝ යං දුමින්දං යති නන්දනේන**
**සම්පූජිතං පූජයතේ සපඤ්ඤො**
**සෝ භොගවා හෝති අනීතිකෝ ච**
**සබ්බත්ථ සෝ හෝති පසත්ථ රූපෝ**

ශාක්‍ය මුනින්ද්‍රයන් වහන්සේ විසිනුත් කළගුණ සැලකීම් වශයෙන් අනිමිස ලෝචන පූජාවෙන් පූජා කරන ලද බෝසමිඳුට යමෙක් පූජා සත්කාර කරන්නේ නම් හෙතෙම භෝග සම්පත් ලබයි. නිරෝගී වෙයි. සෑම තැන්හි විශිෂ්ට රූප සම්පත් ලබයි.

**උපාසතී පදා ගන්ත්වා - යෝ නරෝ බෝධි පාදපං**
**ගන්ධො ද දීප ධූපාදි - නානා පූජාහි සාධුකං**

**සනරෝ නිරාමයෝ හෝති - පච්චත්තේ ච පරත්ථ ච**
**පූජිතෝ මානිතෝ හෝති - දීඝායු බලවා සුඛී**

**තදත්ථං පත්ථයන්තේ න - අත්ථ කාමේන ජන්තුනා**
**උපාසනීයෝ සද්ධාය - නිච්චං සෝ බෝධිපාදපෝ**

විජය ශ්‍රී මහා බෝධි - ශාඛා බෝධි - ඵලරුහ බෝධි යන තුන් බෝධි අතුරෙන් යම්කිසි බෝධීන් වහන්සේ නමක් වෙත සැදැහැයෙන් යමෙක් නිතර පැමිණේ නම් තවද, මල්-පහන්-සුවඳ දුම් - සුවඳ පැන් ආදි නානා පූජාවන් ගෞරවයෙන් සිදු කෙරේ නම් හෙතෙම මෙලොවත් පරලොවත් නිරෝගිමත් වන්නේය. පූජිතද මානිතද වන්නේය. දීර්ඝායු ලබන්නේය. කායබල ඥාන බල ලබන්නේය. කායික මානසික සුවයෙන් සුවපත් වන්නේය. එනිසා තම තමාට හිත සුව, කැමති නැණවත් සැමදෙනා විසින් ශ්‍රද්ධාවෙන් භක්තියෙන් බෝධීන් වහන්සේ වෙත පැමිණීමත්, පූජා සත්කාරත්, කළයුතු වන්නේය යනු ගාථා පෙළේ තේරුමය.

බෝධි පූජා ආරම්භයේදී හැකිතාක් බුද්ධගුණ ආවර්ජනා කොට පටන් ගැනීම ඉමහත් අනුසස් ලැබීමට හේතුවකි. "සිද්ධාර්ථ ගෞතම ශාක්‍ය මුනීන්ද්‍ර සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේගේ ප්‍රථම අභිනිහාරයෙහි පටන් බෝධි මණ්ඩලය දක්වා පුරණ ලද අසීමිත බෝධිකාරක ධර්මයන්ගේ ආනුභාව බලයෙන් ද බෝධි මූලයේදී ප්‍රතිලාභ කරන ලද නව අරහාදි බුද්ධ ගුණානුභාව බලයෙන් ද, දශබල ඥානානුභාව බලයෙන් ද චතු විසාරද ඥානානුභාවයෙන් ද චතුපටිසම්භිදා ඥානානුභාවයෙන්ද, චුද්දස බුද්ධ ඥානානුභාවයෙන්ද සෝළස මහා ඥානානුභාවයෙන් ද අෂ්ඨාරස බුද්ධ ගුණානුභාවයෙන් ද,

එකුන්විසි ප්‍රත්‍යාවේක්‍ෂා ඥානානුභාවයෙන් ද, සමත්‍රිංසත් පාරමිතා ඥානානුභාවයෙන්ද, සත්තිස් බෝධිපාක්ෂික ධර්ම-සත්තිස් සමධර්ම-අටතිස් මංගල ධම් සුසාලිස් ඥාන වස්තු සම පණස් උදයව්‍යය ඥානානුභාවයෙන් ද, තෙසැත්තෑ සඳාණ සත්සැත්තෑ ඥානානුභාවයෙන්ද, සූවිසි කෝටි ලක්ෂවාර සමාපත්ති සංචාරක අර්හත්ඵල වජ්‍රඥානානුභාවයෙන් ද, අනන්ත නය සමන්නාගත සමන්ත පට්ඨාන මහා ප්‍රකරණ විෂයන්තර්ගත ගාම්භීර ඥානානුභාවයෙන් ද,

ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඥාන ආසයානුසයේ ඥානානුභාවයෙන් ද යමක ප්‍රාතිහාර්ය ඥාන මහා කරුණා සමාපත්ති ඥානානුභාවයෙන්ද, සර්වඥතා ඥාන අණාවරණ ඥානානුභාව බලයෙන්ද, විජය ශ්‍රී බෝධි

රාජයාණන්ගේ ආනුභාවයෙන්ද, සූවාසූ දහසක් ධර්ම ස්කන්ධානුභාවයෙන්ද, දන්ත ධාතූන් වහන්සේගේ ආනුභාවයෙන්ද, ලලාට ධාතු, ග්‍රීවා ධාතු, කේශ ධාතු, සෝළස ද්‍රෝණයක් සර්වඥ ධාතූන් වහන්සේලාගේද ආනුභාවයෙන්ද, සත් බුදුවරයන්ගේද, අටවිසි බුදුවරයන් වහන්සේලාගේ ආනුභාවයෙන්ද පන්ලක්‍ෂ දොලොස් දහසක් සර්වඥයන් වහන්සේලාගේද, ලොව පහළ වී වදාළාවූ අනන්තාපරිමාණ සම්මා සම්බුදු රජාණන්වහන්සේලාගේද අනන්ත බුද්ධ ඥානානුභාව බලයෙන්ද, අනන්ත බුද්ධ ගුණානුභාව බලයෙන්ද, අනන්ත බුද්ධ තේජානුභාව බලයෙන්ද, අනන්ත බුද්ධ සෘද්ධ්‍යානුභාව බලයෙන්ද, රත්නත්‍රයේ සතු අසීමිත සූවිසි මහාගුණානුභාව බලයෙන්ද,

අප සැමට සැම කල්හි සෙතක් ශාන්තියක්, සැපතක්, ආරක්‍ෂාවක්, ආශීර්වාදයක් සැලසේවා. අසනීප, අපල, උපද්‍රව, අතුරු අන්තරා, ග්‍රහදෝෂ, මාරක බාධක, සතුරු කරදර, අණවිණ, කොඩි විණ. බන්ධන, ඇස්වහ කටවහ, අලාභ, අයස, නින්දා අපහාස, අභූත චෝදනා, දුක් පීඩා සියල්ල හිරුදුටු අඳුරු සේ විහත විද්වංශනය වේවා. ආරක්ෂාව සෙත ශාන්තිය සැලසේවා. තබන පියවරක් පියවරක් පාසා හෙලන හුස්ම රැල්ලක් පාසා ගෙවන විනාඩියක් පාසා රත්නත්‍රයේ සූවිසි මහා ගුණයේ අසීමිත ආරක්ෂාව සැලසේවා.

රජුන්ගෙන්, සොරුන්ගෙන්, සතුරන්ගෙන්, ගින්නෙන්, ජලයෙන්, වස විසෙන්, අවිආයුධයෙන්, මනුෂ්‍යයන්ගෙන්, අමනුෂ්‍යයන්ගෙන්, තිරිසන් ගත සතුන්ගෙන්, සීතලෙන්, උණුසුමෙන්, බඩගින්නෙන්, පිපාසයෙන්, මැසි මදුරුවන්ගෙන්, විසකුරු සර්පයන්ගෙන්, වාතෙන්, පිතෙන්, සෙමෙන්, රාගෙන්, දෝසෙන්, මෝහයෙන්, උපපීළක, උපච්ඡේදක අකුශල විපාක වාරයකින්වත් බියක් තැති ගැන්මක් අන්තරාවක් සන්ත්‍රාසයක් රෝමෝද්ගමනයක් හිංසාවක්, පීඩාවක්, ව්‍යසනයක්, විපතක් සිහිනෙකින්වත් නොම වේවා ! කාය චිත්ත පීඩාදියෙන් නොම වී කායික මානසික සැනසීම ලැබේවා !

ලාභ අලාභ, යස අයස, නින්දා ප්‍රසංසා, සැප දුක් යන අට ලෝ දහමෙන් කම්පා නොවීමේ චිත්තබලය-චිත්ත සමාධිය-චිත්තේකාග්‍රතා-චිත්තවසීභාවය-චිත්ත ධෛර්‍ය්‍ය-චිත්ත ශක්තිය ලැබේවා. ගුණයෙන්, නුවණින්, ධනයෙන්, ධාන්‍යයෙන්, යසසෙන්, ඓශ්වර්යයෙන්, සැපතෙන්, සම්පතින්, ආයු වර්ණ සැප බල ප්‍රඥාවෙන්, නිත්‍ය ශීල උපෝස්ථ

ශීලයෙන්, සිවුබඹ විහරණ සතර සංග්‍රහ වස්තුවෙන් දශ පාරමිතා දි බෝසත් ගුණයන්ගෙන් පෙරපස වැඩෙන පුරසඳ මඩලක් සේ දිනෙන් දින දියුණුවට පත්වේවා ! සම්‍යක් ප්‍රාර්ථනා සියල්ල සිතුමිණි රුවනකින් මෙන් සිතූ පැතූ සේ ද පූර්ණ චන්ද්‍රයා සේ පිරී ඉතිරී සමෘද්ධිමත් වේවා ! විංශත් ශත වර්ෂාධික කාලයක් අතරක් නැර අපරාජිතව උදාර ලෙස උත්තරීතර ලෙස උත්කෘෂ්ට ලෙස මෙලොව දියුණුවත් පරලොව ජයග්‍රහණයත් ශාන්ත නිර්වාණාවබෝධයත් පිණිස පාරමී පිරීමේ ශක්තිය, ධෛර්‍ය්‍යය, ආරක්‍ෂාව, ආශීර්වාදය, සතිය, සමාධිය, ඥාණය, ඡන්දය, චිත්තය, වීර්යය, විමංසාවද, රත්නත්‍රයානුභාව බලයෙන් ලැබේවා !

සුවඳ තෙලින් දල්වන ලද තෙල් පහන් ආලෝකයෙන් ද විදුලි පහන් ආලෝකයෙන් ද පැවැත්වෙන ආලෝක පූජා වේ ආනුභාවයෙන් අකුශල විපාක දුක් අඳුරු දුරු වේවා. කෙලෙස් අඳුරු දුරුවේවා. අවිදු අඳුරු දුරු වේවා. ධර්මා ලෝකය ප්‍රඥා ලෝකය ලැබේවා. සීල, සමාධි, ප්‍රඥාවෙන් ද සතර සතිපට්ඨානාදි ආලෝකයෙන් ද, ධ්‍යාන සමාධි සමාපත්ති, අභිඥා විදර්ශනා ඥානාලෝකයෙන්ද, ආලෝකවත්ව, නිවන් මග පාරමී පුරා ගැනීමට ජාති ජාතිත් ආලෝකය ලැබේවා.

සුගන්ධ ධූප පූජාවේ ආනුභාව බලයෙන් බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලාගේ ද අසීමිත සිල් සුවඳ, ගුණ සුවඳ, නැණ සුවඳ, දහම් සුවඳ, නිවන් සුවඳ විඳිමින් ශීලාදි ගුණ සුවඳ විහිදුවමින් නිවන්මග යාමට ජාති ජාතිත් වාසනා වේවා.

මල් පූජාවේ ආනුභාවයෙන් කයින්, වචනින්, සිතින් පිරිසිදු සන්තාන ඇතිව ශ්‍රද්ධා ශීල ශ්‍රැත, ත්‍යාග ඥාන ගුණයෙන් ද දානාදි දශ පාරමිතා ගුණයෙන් ද, සතිපට්ඨානාදි සත්තිස් බෝධි පාක්‍ෂික ධර්මයෙන්ද, ධ්‍යාන සමාපත්ති අභිඥා විපස්සනා ඥානයෙන්ද පිරිසිදු සන්තාන ඇතිව නිවන් මග යාමට ජාති ජාතිත් වාසනා වේවා. මල්දම් හා විසිතුරු කොඩි පූජාවේ ආනුභාවයෙන් ශ්‍රද්ධා ශීල ශ්‍රැත ත්‍යාග ඥාන ගුණයන්ගෙන්ද, දානාදි දස පාරමිතා වෙන්ද, බෝධිපාක්ෂික ධර්මයන්ගෙන්ද, ධ්‍යානාදි අධිගමයෙන්ද, උත්තුංග බවට, උසස් බවට ශ්‍රේෂ්ඨ භාවයට මහේශාක්‍ය භාවයට පත් වී අපරාජිතව නිවන් මග යාමට හේතු වේවා.

අෂ්ඨපාන ගිලන්පස, චතුමධුර, දැහැත්, බෙහෙත්, ඖෂධ පූජාවේ ආනුභාව බලයෙන් නිවන් දක්නා තුරු බක්කුල මහරහතන් වහන්සේ, අනුරුද්ධ මහරහතන් වහන්සේ, මහා කාශ්‍යප මහරහතන් වහන්සේ, අනඳ මාහිමියන් වහන්සේ, විශාඛා මහ උපාසිකා මාතාව ආදී මහා පිනැතියන් හට මෙන් නිරෝගී ජීවිත වාසනා ඇතිව නිරෝගීව දසපාරමිතා ධ්‍යානාභිඥාදිය උපදවා පරම නිරෝගී සුවය වන ශාන්ත නිර්වාණ ධාතුව ශාක්ෂාත් කරගැනීම පිණිස හේතුවේවා.

සුවඳ පැන් අභිෂේක පූජාවෙහි ආනුභාව බලයෙන් සුවඳවත් කයක්, සුවඳවත් ජීවිතයක් ඇතිව කායදාහයක්, මානසික දාහයක්, ක්ලේශ දාහයක් නැති නිවුණු සැනසුණු ජීවිත ඇතිව මාරක බාධක අතුරු අන්තරා අභිභවා නිවන් මග යාමේ කාය බලය, ඥාන බලය, පාරමී බලය, පුණ්‍ය බලය ලැබේවා. වැඩේවා.

ශිලාදී ප්‍රතිපත්ති පූජාවේ ආනුභාවයෙන් ක්ලේශ මාරාදී පඤ්ච මාර බල බිඳ දමා ශිලයෙන්, සමාධියෙන්, ප්‍රඥාවෙන්, ප්‍රතිපත්තියෙන් පෙර පස සඳක් සේ විරාජමානව නිවන් මග යාමේ ශක්තිය, බලය, ධෛර්ය, වීර්යය, ජාති ජාතිත් ලැබේවා. වැඩේවා. යනාදී පිරිසිදු චිත්ත සංකල්පනා උපදවාගෙනම බෝධි පූජා, බුද්ධ පූජා, ඥාන පූජා පවත්වා ගැනීමෙන් සාන්දෘෂ්ඨික වශයෙන් එදිනෙදාම අනුසස් ලබාගත හැකි බව ශාසන ගෞරවයෙන් පිළිගත යුතුවේ.

ශ්‍රද්ධාවන්ත බෞද්ධ ජනතාවගේ ලොව්තුරා හිතසුව පිණිස මේ බෝධි වන්දනා දහම් පොත නැවත මුද්‍රණය කරවා ධර්ම දානමය වශයෙන් පිරිනමනුයේ ඩබ්. ඩී. මෙන්ඩිස් මහත්මා, වෛද්‍යාචාරිනී පුෂ්පා ගුණරත්න මහත්මනිය සහ රම්‍යා ගුණරත්න මහත්මනිය ද විසිනි.

මෙම ධර්ම දානමය කුසලයෙන් ජනිත පුණ්‍ය සම්භාරය පරලෝ සැපත් වෛද්‍යාචාර්ය ඩී. ඩී. ඉසෙඩ් ගුණරත්න මහත්මා, ඩබ්. ඩීඩීන් මෙන්ඩිස් මහත්මා, ටී. එස්. මෙන්ඩිස් ගුණරත්න මාතාව නම්වූ මා පිය තිදෙනා වහන්සේට ද සුසිල් ගුණරත්න නම්වූ සොහොයුරාට සහ කෞශල්‍යා බුද්ධිමනී දියණියට අග්‍ර අමාමහ නිවන් සුව පිණිස හේතු වාසනා වේවා ! පරලෝ සැපත් දෙපාර්ශවයේම සියලු ගුරුවර, ඥාති, මිත්‍රාදීන්ටත් සිසු සැමටත් අමාමහ නිවන් සුව අත්වේවා !

මෙම ධර්මදානානිසංස පුණ්‍යානුභාවයෙන් සහ රත්නත්‍රයේ අසීමිත සූවිසි මහා ගුණානුභාව බලයෙන් වයෝවෘද්ධ පිංවත් මෙන්ඩිස් මැණියන්ටත්, සත් ගුණවත් ඩබ්. ඩී. මෙන්ඩිස් මහත්මාටත් එම පුණ්‍යාත්මී රම්‍යා ගුණරත්න මහත්මනියටත් චරංසි හා මිලින්ද පින්වත් දරුවන් දෙදෙනාටටත්, වෛද්‍යාචාරිනී පුෂ්පා ගුණරත්න මහත්මනියටත්, අසනීපයෙන් පසුවන රානි ගුණරත්න මහත්මනියටත්, රංජිත් ගුණරත්න, රන්සිරිනි, මල්ලිකා ගුණරත්න, හේමා හඳුන්නෙත්ති, ඔල්ගා ගුණරත්න, ලලිත් ගුණරත්න යන මහත්ම මහත්මනියන්ට හා පවුල්වල සැමට විශේෂයෙන් පෙබරවාරි 22 උපන් දිනය සමරන හිටපු විදුහල්පති එම්. යූ. ජයසේකර මහතා ඇතුළු දෙපාර්ශ්වයේම සියළුම සහෝදර, සහෝදරි, ගුරුවර, ඥාති මිත්‍රාදි සිසු පිරිස සහිත පවුල්වල සැමටත් ආයුරාරෝග්‍ය සම්පත් හා සම්‍යක් ප්‍රාර්ථනා මුදුන්පත් වී දෙලොව ජය අත්වී ශාන්ත නිර්වාණාවබෝධය තෙක් හේතු වාසනා වේවා !

මේ පොත භාවිතා කරන පුණ්‍යකාමී සැමටත්, සෝභන ලෙස මුද්‍රණය කළ සක්වා මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් සෙතත්, ශාන්තියත්, ආරක්ෂාවත්, ආරෝග්‍ය සම්පත්තියත්, රත්නත්‍රයානුභාව බලයෙන්ම සාක්ෂාත් වේවා.

මෙය අනුමත කොට වදාළ අස්මදාචාර්ය **අතිපූජනීය රාජකීය පණ්ඩිත කඩවැද්දුව ශ්‍රී ජිනවංශාභිධාන මහෝපාධ්‍යාය මාහිමියන් වහන්සේටත්** විංශත් ශතවර්ෂාධික කාලයක් දීර්ඝායු ශ්‍රී අත්වී මතු උතුම් බුදුබවම අත්වේවා !

*සබ්බේ සත්තා - භවන්තු සුඛිතත්තා !*

**මෙතැනි,**
**පූජ්‍ය නාඋයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ**

ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රම මධ්‍යස්ථානය
ගල්දූව - කහව.
2009. 04. 20

"සබ්බ දානං ධම්ම දානං ජිනාති"

# අපගේ ප්‍රාර්ථනය

2006 වසරේදී අපගේ මග පෙන්වීම පරිදි මහරගම ගුරු විදුහලේ සිසු පිරිස විසින් මෙම බෝධි වන්දනා පොතේ සකස් කළ ඡායා පිටපතක් උපයෝගී කරගනිමින් විදුහලේ බුදු මැදුරේදී බදාදා උදෑසන බෝධි වන්දනාව සිදු කරන ලදි. ඉංග්‍රීසි අංශයේ බණ්ඩාර ගුරු මහතා, එම ඡායා පිටපත් තම බිළිඳු පුතුට පිං පිණිස ගුරු සිසු පිරිස අතර බෙදාදෙනු ලැබීය. එමගින් දැල්වුණු මෙම පොත මුද්‍රණය කිරීමේ බලාපොරොත්තුව සාර්ථක කර ගත හැකිවූයේ අතිපූජනීය නාඋයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේ ඒ සඳහා අවසර ලබාදුන් හෙයිනි. උන්වහන්සේගේ ජන්ම දිනය නිමිතිකොට (අප්‍රේල් 24) අප විසින් තෙවෙනි වරට සිදු කරන ධර්ම දානමය පිංකම ලෙස මෙම පොත නැවත මුද්‍රණය කිරීමට ලැබීම ඉමහත් භාග්‍යයක් හා වාසනාවක් සේ සලකමු.

පන්දහසක් කල් නිර්මල බුදු දහම මේ ශ්‍රී ලංකා ධරණී තලය තුළ අවිච්ඡින්නව පවත්වා ගැනීමේ පරම පිවිතුරු චේතනාවෙන් අතිපූජනීය **රාජකීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංසාභිධාන නාහිමිපාණන් වහන්සේ** ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රම සංස්ථාව පිහිටුවා වදාළ සේක. උන්වහන්සේගේ දුර දක්නා නුවණින් හා කරුණා මහිමයෙන් බිහිවූ මෙම යෝගාශ්‍රමයෙන් ගිහි පැවිදි දහස් සංඛ්‍යාත පිංවතුනට පරම ශාන්ත නිවන් මග උදාකර ගැනීමේ භාග්‍යය උදාවී ඇත්තේය. මෙම ශ්‍රේෂ්ඨ යතිවරයාණන් වහන්සේගේ ජන්ම දිනය අප්‍රේල් 01 දිනට යෙදී තිබිණි. අපවත්වීමෙන් පසුවද එදිනට දහස් සංඛ්‍යාත ගිහි පැවිදි බැතිමතුන් එක්රැස්ව උන්වහන්සේට බුදු බව ප්‍රාර්ථනා කළහ. අපිදු උන්වහන්සේට මතු අනාගතයේ ප්‍රාර්ථනා පරිදි ලොව්තුරා බුදුබව ලබත්වා යි මේ ධර්ම දානමය පුණ්‍යකර්මය අනුමෝදන් කරවමින් ප්‍රාර්ථනා කරමු.

අතිපූජ්‍ය **නාඋයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේ** ගල්දූව ගුණවර්ධන යෝගාශ්‍රමයට සම්බන්ධ මිතිරිගල නිස්සරණ වන සේනාසනය, නිමලව ආරණ්‍ය සේනාසනය ආදි 170 ක් පමණ වන සෙනසුන් හා මධ්‍යස්ථානවල වෙසෙන යෝගාවචර භික්ෂූන් වහන්සේලාට අවශ්‍ය කුදු මහත් සියලු උපදෙස් හා මගපෙන්වීම, ගිහි පිංවතුනට පංති පවත්වමින් සමථ හා විදර්ශනා භාවනා ඉගැන්වීම, දහම් පත පොත ලියා පලකෙරෙමින්, ධර්මදේශනා පවත්වමින් සම්බුදු දහම් ප්‍රචලිත කිරීම ආදි අති විශාල ශාසනික සේවාවක යෙදී සිටිති.

සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා මෙසේ උරදී කැපවී කටයුතු කරන ගල්දුව ගුණවර්ධන යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රධාන අනුශාසක ත්‍රිපිටකාචාර්ය, කම්මට්ඨානාචාර්ය අතිපූජ්‍ය නාඋයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේගේ අතින්ම ලියැවුන මෙම ධර්ම ග්‍රන්ථය උන්වහන්සේට දිගාසිරි පතා මුද්‍රණය කර පූජා කරමු.

මෙම පොත කියැවීමට ලැබෙන සත්පුරුෂයන්ගෙන් අප කාරුණිකව අයැද සිටින්නේ "පූජ්‍යපාද නාඋයනේ **අරියධම්ම මහා ස්ථවිරයන් වහන්සේ** සලසන උදාර ශාසනික මෙහෙවර තව තවත් හොඳින් ඉටු කිරීමට රත්නත්‍රයේ ගුණ මහිමයෙන් ලෝක පාලක දෙවියන්ගේ අනුග්‍රහයෙන් හැකිවේවා. උන්වහන්සේට දීර්ඝායුඃ ශ්‍රී සම්පත් නිරෝගී බව හා උතුම් වූ ලොව්තුරා බුදුබව අත්වේවා"යි යනුවෙන් නිති ප්‍රාර්ථනා කරන ලෙසයි.

අපගේ පරලෝ සැපත් දෙමාපියන්, සහෝදර, දුහිතෘ ගුරුවර බන්ධුමිත්‍ර හා සිසු සැමට, සුජිවත්ව සිටින ස්වාමිපුරුෂයා එම මැණියන්වහන්සේ, මිලින්ද හා වරංසි දරු දෙදෙනා දෙපාර්ශවයේ සියලුම ඥාති මිත්‍රාදීන්ට ආදරබර ගුරුවර, වැඩිහිටි බන්ධු මිත්‍ර ශිෂ්‍ය ශිෂ්‍යාවන් සැමට ද ලෝ සැමටද පින් කැමති දෙවියන්ට ද මේ කුසලය අත්වේවා !

විශේෂයෙන් අප්‍රේල් 24 උපන්දිනය උදාවන අතිපූජනීය නාඋයනේ අරියධම්ම මාහිමිපාණන් නිදුක් නිරෝගී භාවය දීර්ඝායුෂ හා පැතුම් පිරිදී උතුම් ලොව්තුරා බුදුබව ම ලැබේවා.

එසේම අපට පුණ්‍යානුමෝදනය සිදුකළ ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා සමලේඛකාධිකාරී කහගොල්ලේ සෝමවංශ මාහිමිපාණන් වහන්සේ හා ගෞරවනීය සංඝරත්නයද මෙම පින අනුමෝදන් වෙත්වා.

*සාධු ! සාධු !! සාධු !!!*

මෙයට ධර්මයට කැමති,
හිටපු කථිකාචාරිනී,
**රම්‍යා ගුණරත්න**

19, තල්ගහවත්ත මාවත,
බොරලැස්ගමුව.

# බෝධි වන්දනාව

## තිසරණ සහිත

## ආජීව අෂ්ඨමක සීල සමාදානය

*නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!*

බුද්ධං සරණං ගච්ඡාමි
ධම්මං සරණං ගච්ඡාමි
සංඝං සරණං ගච්ඡාමි

දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
දුතියම්පි සංඝං සරණං ගච්ඡාමි

තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
තතියම්පි සංඝං සරණං ගච්ඡාමි

පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි
අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
කාමේසුමිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි
මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි

පිසුණාවාචා වේරමණී සික්ඛාපදං සමාදියාමි
ඵරුසාවාචා වේරමණී සික්ඛාපදං සමාදියාමි
සම්ඵප්පලාපා වේරමණී සික්ඛාපදං සමාදියාමි
මිච්ඡා ආජීවා වේරමණී සික්ඛාපදං සමාදියාමි

(පඤ්ච සීල - අෂ්ඨාංග සීල - දස සීලාදිය
මෙසේ සමාදන්වීම මැනවි)

## මල්-පහන්-සුවඳ පැන් ආදී පූජාවස්තූන් සූදානම් කිරීමේදීත් අතින් අත යැවීමේදීත් පූජාසන මත තැන්පත් කිරීමේදීත් භාවිතා කළයුතු බුදුගුණ

*නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!*

ඉතිපි සෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ විජ්ජාචරණ සම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්ම සාරථි සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවාති.

සෝ භගවා ඉතිපි අරහං - අරහං වත සෝ භගවා - තං භගවන්තං අරහන්තං සරණං ගච්ඡාමි තං භගවන්තං අරහන්තං සිරසා නමාමි, සාධු, සාධු, සාධු.

සෝ භගවා ඉතිපි සම්මා සම්බුද්ධෝ - සම්මා සම්බුද්ධෝ වත සෝ භගවා - තං භවන්තං සම්මා සම්බුද්ධං සරණං ගච්ඡාමි - තං භගවන්තං සම්මා සම්බුද්ධං සිරසා නමාමි, සාධු, සාධු, සාධු.

සෝ භගවා ඉතිපි විජ්ජාචරණ සම්පන්නෝ - විජ්ජාචරණ සම්පන්නෝ වත සෝ භගවා - තං භගවන්තං විජ්ජාචරණ සම්පන්නං සුගතං සරණං ගච්ඡාමි - තං භගවන්තං සුගතං සිරසා නමාමි, සාධු, සාධු, සාධු.

සෝ භගවා ඉතිපි ලෝකවිදූ - ලෝකවිදූ වත සෝ භගවා - තං භගවන්තං ලෝකවිදූං සරණං ගච්ඡාමි. තං භගවන්තං ලෝක විදූං සිරසා නමාමි, සාධු, සාධු, සාධු.

සෝ භගවා ඉතිපි අනුත්තරෝ පුරිසදම්ම සාරථි - අනුත්තරෝ පුරිසදම්ම සාරථි වත සෝ භගවා තං භගවන්තං අනුත්තරං පුරිසදම්ම සාරථිං සරණං ගච්ඡාමි - තං භගවන්තං අනුත්තරං පුරිසදම්ම සාරථිං සිරසා නමාමි. සාධු, සාධු, සාධු.

සෝ භගවා ඉතිපි සත්ථා දේවමනුස්සානං - සත්ථා දේවමනුස්සානං වත සෝ භගවා - තං භගවන්තං සත්ථාරං දේවමනුස්සානං සරණං ගච්ඡාමි - තං භගවන්තං සත්ථාරං දේවමනුස්සානං සිරසා නමාමි, සාධු, සාධු, සාධු.

සෝ භගවා ඉතිපි බුද්ධෝ - බුද්ධෝ වත සෝ භගවා - තං භගවන්තං බුද්ධං සරණං ගච්ඡාමි - තං භගවන්තං බුද්ධං සිරසා නමාමි, සාධු, සාධු, සාධු.

සෝ භගවා ඉතිපි භගවා - භගවා වත සෝ භගවා තං භගවන්තං භගවන්තං සරණං ගච්ඡාමි - තං භගවන්තං භගවන්තං සිරසා නමාමි, සාධු, සාධු, සාධු.

නමෝ තේ පුරිසාජඤ්ඤ
නමෝ තේ පුරිසුත්තමං
නමෝ තේ පුරිසාතුලය
නමෝ තේ පුරිසාසභ

ආජඤ්ඤ පුරිස වූ බුදුරජාණන් වහන්ස ! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා. උත්තම පුරිස වූ බුදුරජාණන් වහන්ස ! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා !

අසම පුරිස වූ බුදුරජාණන් වහන්ස ! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා !

ශ්‍රේෂ්ඨ පුරුෂ වූ බුදුරජාණන් වහන්ස ! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා !

සාධු ! සාධු !! සාධු !!!

නමෝ තේ සබ්බ දස්සාවි
නමෝ තේ කරුණාකර,
නමෝ තේ තිණ්ණ සංසාර
නමෝ තේ අමතං දද !

සියල්ල දක්නා වූ බුදුරජාණන් වහන්ස ! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා.

දයා සාගර වූ බුදුරජාණන් වහන්ස ! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා.

සසර කතරින් එතරවූ බුදුරජාණන් වහන්ස ! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා.

නිවන් අමාසුව දෙන්නා වු බුදුරජාණන් වහන්ස ! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා.

සාධු ! සාධු !! සාධු !!!

සංසාර සාරෝඝ විනීත   නිසං
සංනීත සාතං සුචි සාර   ධීසං
සංධීරකං සොණ්ණ තනුපලා   සං
සංලාප දේසිං පණමේහිසා   සං

සංසාහිගං කේවල මෝහ   නාසං
සංනාහකං මාර රණේ   විසේසං
සංසේවිතං දාසි මුදාර   හාසං
සංහාර ධම්මං පණමේ සදා   සං

සංදාසගං නාසිත පාප   නාසං
සංනාප ධංසිං හතඝෝර   පාසං
සංපාරගාමිං සුචි සාර   වාසං
සංචාර සංඝං පණමේ   සදාසං

නමෝ නමෝ බුද්ධ   දිවාකරාය
නමෝ නමෝ ගෝතම   චන්දිමාය
නමෝ නමෝ නන්ත   ගුණණ්ණවාය
නමෝ නමෝ සාකිය   නන්දනාය

බ්‍රහ්මින්ද දේවින්ද නරින්ද   රාජං
බෝධිං සුබෝධිං කරුණා   ගුණග්ඝං
පඤ්ඤා පදීපුජ්ජලිතං   ජලන්තං
නමාමි බුද්ධං භව පාර   තිණ්ණං

බුද්ධෝති වචනං   සෙට්ඨං
බුද්ධෝති පද   මුත්තමං
නත්ථි තේන සමං   ලෝකේ
අඤ්ඤං සෝත   රසායනං

බුද්ධේ චිත්තප්පසාදේන - ධම්මේ සංඝෙ ච යෝ නරෝ
කප්පානි සත සහස්සානි - දුග්ගතිං සෝ නගච්ඡති.

යෝ වාදතං පවරෝ මනුජේසු
සක්‍ය මුනී භගවා කත කිච්චෝ
පාරගතෝ බල විරිය සමංගි
තං සුගතං සරණත්ත මුපේමි.

රාග විරාග මනේජ මසෝකං
ධම්ම මසංඛත මප්පටි කූලං
මධුරමි මං පගුණං සුවිභත්තං
ධම්ම මිමං සරණත්ත මුපේමි

යත්ත ච දින්න මහප්ඵල මාහු
චතූ සූ සුචී සූ පුරිස යුගේසු
අට්ඨ ච පුග්ගල ධම්ම දසාතේ
සංඝමි මං සරණත්ත මුපේමි

සාධු ! සාධු !! සාධු !!!

## බෝධි වන්දනාව සහිත බුද්ධ පූජාව

*නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!*

### ආරාධනාව

යාවතා භගවා ලෝකේ - තිට්ඨෙය්‍ය තව සාසනං
තාවතා පතිගණ්හාතු - පූජා ලෝකානුකම්පයා

### තෙල්පහන් පූජාව

ගන්ධ තේලප්පදිත්තේන - දීපේන තම ධංසිනා
තිලෝක දීපං සම්බුද්ධං - පූජයාමි තමෝනුදං

## විදුලි පහන් පූජාව

විජ්ජුල්ලතා පදිත්තේන - දීපේන තම ධංසිනා
තිලෝක දීපං සම්බුද්ධං - පූජයාමි තමෝනුදං

## සියලු පහන් ආලෝක පූජාව

තිලෝක මහිතං සම්බුද්ධං - දීපේන පූජයාමහං
තේන ධම්මේන සංසාරේ - චක්ඛු සුප්සඨතු සබ්බදා

වේනෙයස හදයේ මෝහ - නමෝක්ඛන්ධ විනෝදකං
දීපේනේතේන පූජේමි - පසද්සදා දීප ධරං ජිනං

ඉමිනා පුසද්සදකම්මේන - පසද්සදවා සීලවා සදා
භවිත්වාහං ලභේ සීඝං - ධම්මචක්ඛුං අනුත්තරං

## මල් පූජාව

වණ්ණගන්ධ ගුණෝපේතං - එතං කුසුම සන්තතිං
පූජයාමි මුනින්දස්ස - සිරිපාද සරෝරුහේ

පූජේමි බුද්ධං කුසුමේනනේන - පුසද්සෙද්න මේතේන ලභාමි මොක්ඛං
පුප්ඵං මිලායාති යථා ඉදං මේ - කායෝ තථා යාති විනාස භාවං

## කොඩි පූජාව

ධම්මද්ධජ ධරං ධීරං - ධජුග්ගත මහා යසං
ධජේනේතේන පූජේමි - ධම්මරාජං ධජූපමං

## පැන් පූජාව

සුගන්ධං සීතලං කප්පං - පසන්න මධුරං සුභං
පානීය මේතං භගවා - පතිගණ්හාතු මුත්තමං

## අෂ්ඨපාන පූජාව

අධිවාසේතු නෝ භන්තේ - අට්ඨපානං පරිකප්පිතං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං

## චතුමධුර පූජාව

අධිවාසේතු නෝ භන්තේ - චතුමධුරං පරිකප්පිතං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං

## බෙහෙත් ඖෂධ පූජාව

අධිවාසේතු නෝ භන්තේ - භේසජ්ජං පරිකප්පිතං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං

## දැහැත් පූජාව

නාගවල්ලි දළුපේතං - චුණ්ණ පූග සමායුතං
තාම්බූලං පතිගණ්හාතු - සකප්පූර මිදං පිනො

## බුද්ධ වන්දනාව

ඉතිපි සෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ විජ්ජාචරණ සම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්ම සාරථි සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවාති.

බුද්ධං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි.

යේච බුද්ධා අතීතා ච - යේච බුද්ධා අනාගතා
පච්චුප්පන්නා ච යේ බුද්ධා - අහං වන්දාමි සබ්බදා

නත්ථි මේ සරණං අඤ්ඤං - බුද්ධෝ මේ සරණං වරං
ඒතේන සච්චවජ්ජේන - හෝතු මේ ජයමංගලං

උත්තමංගේන වන්දේහං - පාදපංසු වරුත්තමං
බුද්ධේ යෝ ඛලිතෝ දෝසෝ - බුද්ධෝ ඛමතු තං මමං

## ධර්ම වන්දනාව

ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ සන්දිට්ඨිකෝ අකාලිකෝ
ඒහිපස්සිකෝ ඕපනයිකෝ පච්චත්තං වෙදිතබ්බෝ විඤ්ඤූහීති

ධම්මං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි

යේච ධම්මා අතීතා ච - යේච ධම්මා අනාගතා
පච්චුප්පන්නාච යේ ධම්මා - අහං වන්දාමි සබ්බදා

නත්ථි මේ සරණං අඤ්ඤං - ධම්මෝ මේ සරණං වරං
ඒතේන සච්චවජ්ජේන - හෝතු මේ ජයමංගලං

උත්තමංගේන වන්දේහං - ධම්මඤ්ච තිවිධං වරං
ධම්මේ යෝ ඛලිතෝ දෝසෝ - ධම්මෝ ඛමතු තං මමං

## සංඝ වන්දනාව

සුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ උජුපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ ඤායපටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ සාමීචි පටිපන්නෝ භගවතෝ සාවකසංඝෝ යදිදං චත්තාරි පුරිස යුගානි අට්ඨපුරිස පුග්ගලා ඒසභගවතෝ සාවකසංඝෝ, ආහුනෙය්‍යෝ පාහුනෙය්‍යෝ දක්ඛිණෙය්‍යෝ අඤ්ජලිකරණීයෝ අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්සාති.

සංඝං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි

යේච සංඝා අතීතා ච යේච සංඝා අනාගතා
පච්චුප්පන්නා ච යේ සංඝා - අහං වන්දාමි සබ්බදා

නත්ථි මේ සරණං අඤ්ඤං - සංඝෝ මේ සරණං වරං
ඒතේන සච්චවජ්ජේන - හෝතු මේ ජයමංගලං

උත්තමංගේන වන්දේහං - සංඝඤ්ච තිවිධෝත්තමං
සංඝෙ යෝ ඛලිතෝ දෝසෝ - සංඝෝ ඛමතු තං මමං

සාධු ! සාධු !! සාධු !!!

## චුද්දස බුද්ධ ඥාන වන්දනාව

දුක්ඛේ ඤාණං බුද්ධ ඤාණං, දුක්ඛ සමුදයේ ඤාණං බුද්ධ ඤාණං, දුක්ඛ නිරෝධේ ඤාණං බුද්ධ ඤාණං, දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදාය ඤාණං බුද්ධ ඤාණං, අත්ථ පටිසම්භිදේ ඤාණං බුද්ධ ඤාණං, ධම්ම පටිසම්භිදේ ඤාණං බුද්ධ ඤාණං, නිරුත්ති පටිසම්භිදේ ඤාණං බුද්ධ ඤාණං, පටිභාන පටිසම්භිදේ ඤාණං බුද්ධ ඤාණං, ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඤාණං බුද්ධ ඤාණං, සත්තානං ආසයානුසයේ ඤාණං බුද්ධ ඤාණං, යමක පාටිහාරියේ ඤාණං බුද්ධ ඤාණං, මහාකරුණාසමාපත්තියා ඤාණං, බුද්ධ ඤාණං, සබ්බඤ්ඤුත ඤාණං බුද්ධ ඤාණං, අනාවරණ ඤාණං බුද්ධ ඤාණන්ති, ඉමානි චුද්දස බුද්ධ ඤාණානි. ඉමේසං අට්ඨ ඤාණානි සාවක සාධාරණානි, ඡ ඤාණානි අසාධාරණානි සාවකේහි, ඉමේහි චුද්දස බුද්ධඤාණෙහි සමන්නාගතං සම්මා සම්බුද්ධං භගවන්තං සිරසා නමාමි.

## බෝධි වන්දනාව

යස්ස මූලේ නිසින්නෝව - සබ්බාරි විජයං අකා
පත්තෝ සබ්බඤ්ඤුතං සත්ථා - වන්දේතං බෝධිපාදපං

ඉමේ ඒතේ, මහා බෝධි - ලෝක නාථේන පූජිතා
අහම්පි තේ නමස්සාමි - බෝධිරාජා නමත්ථු තේ

පඨමං බෝධි පල්ලංකං - දුතියඤ්ච අනිම්මිසං
තතියං චංකමනං සෙට්ඨං - චතුත්ථං රතනාඝරං

පඤ්චමං අජපාලඤ්ච - මුචලින්දේන පට්ටමං
සත්තමං රාජායතනං - වන්දේ තං මුනි සේවිතං

මහාකරුණා රස පතිමණ්ඩිතස්ස අනන්ත ඤාණස්ස අසාධාරණ පඤ්ඤස්ස දස පාරමිතා බල සමුදිතස්ස දස බල සමන්නාගතස්ස අපරිමෙය්‍ය ගුණ සාගරස්ස, අම්හාකං සත්ථුනෝ සරස රංසිජාල පරිකිණ්ණං සම්මා සම්බුද්ධ පූජිතං සිරිබෝධිරාජං සිරසා නමාමි.

සාධු ! සාධු !! සාධු !!!

යස්මිං නිසජ්ජ වජිරාසන බන්ධනේන,
ජෙත්වා සවාසන කිලේස බලං මුනින්දෝ,
සම්බෝධි ඤාණ මව ගම්ම විභාසි සම්මා
තං බෝධි චේතිය මහං සිරසා නමාමි

ඉන්දනීල වණ්ණ පත්ත සේතබන්ධ භාසුරං, සත්වූ නෙත්ත පංකජාභි පූජිතග්ග සාතදං, අග්ග බෝධි නාම වාම දේවරුක්ඛ සන්නිභං තං විසාල බෝධි පාදපං නමාමි සබ්බදා.

සුපතිට්ඨිත රට්ඨනුරාධ පුරේ
සමදිට්ඨිත දක්ඛිණ සාඛ භවං
සුභ මේඝ වනම්බර මේඝ නිභං
ජය බෝධිමහං පණ මාමි වරං

වන්දාමි චේතියං සබ්බං - සබ්බ ඨානේසු පතිට්ඨිතං
ශාරීරික ධාතු මහා බෝධිං - බුද්ධ රූපං සකලං සදා !!!

සාධු ! සාධු !! සාධු !!!

සේවිතං ධම්මරාජේන - පත්තුං සම්බෝධි මුත්තමං
වන්දාමි බෝධි රාජානං - නිබ්බාණ සුඛ සිද්ධියා

## පහන් පූජාව

සේවිතං ධම්මරාජේන - පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජානං - දීපාලෝකේන සාදරං

## සුවඳ දුම් පූජාව

සේවිතං ධම්මරාජේන - පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජානං - ගන්ධ ධූපේන සාදරං

## මල් දම් පූජාව

සේවිතං ධම්මරාජේන - පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජානං - ගන්ධ පුප්ඵේන සාදරං

## කොඩි පූජාව

සේවිතං ධම්මරාජේන - පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජානං - ධජේනේතේන සාදරං

## අෂ්ඨපාන පූජාව

සේවිතං ධම්මරාජේන - පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජානං - අට්ඨපානේන සාදරං

## චතුමධුර පූජාව

සේවිතං ධම්මරාජේන - පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජානං - චතුමධුරේන සාදරං

## දැහැත් පූජාව

සේවිතං ධම්මරාජේන - පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජානං - තාම්බුලේන සාදරං

## බෙහෙත් ඖෂධ පූජාව

සේවිතං ධම්මරාජේන - පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජානං - ඕසධේනේන සාදරං

## සුවඳ පැන් පූජාව

සේවිතං ධම්මරාජේන - පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජානං - ගන්ධෝදකේන සාදරං

## සීලාදී ප්‍රතිපත්ති පූජාව

සේවිතං ධම්මරාජේන - පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජානං - පටිපත්තියාහි සාදරං

සාධු ! සාධු !! සාධු !!!

## පූජා වාක්‍යය

නිරෝධ සමාපත්තියෙන් නැගී සිටියාක් මෙන් ද මහාකරුණා සමාපත්තියෙන් නැගී සිටියාක් මෙන් ද, අරහත්ඵල සමාපත්තියෙන් නැගී සිටියාක් මෙන්ද, වැඩ සිටින්නාවූ දෙතිසක් මහා පුරුෂ ලක්ෂණයෙන් ද, අසූවක් අනුව්‍යඤ්ජන ලක්ෂණයෙන් ද, බ්‍යාම ප්‍රභාවෙන් ද, කේතුමාලාලංකාරයෙන් ද, සවණක් ගණ බුදු රැස්මාලා වෙන් ද හිරු මඬලක් මෙන් බබලන්නාවූ,

තුන්ලෝක වාසීන්ගේ ආමිස පූජා ප්‍රතිපත්ති පූජා පිළිගැනීමට යෝග්‍ය වූ, අග්‍ර දක්ෂිණාර්හ වූ. දේවාතිදේව වූ, ශක්‍රාති ශක්‍ර වූ, බ්‍රහ්මාතිබ්‍රහ්ම වූ, මාර පරාජය කළාවූ, වන්දනීය අභිවන්දනීය වූ, පූජනීය අති පූජනීය වූ, දශ බලධාරී වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට ද,

මහා කාරුණික වූ ශාන්තිනායක ධර්මරාජයාණන් වහන්සේ විසින් සර්වඥතා ඥානයට ද පැමිණීම පිණිස සේවනය කරන ලද බෝධිරාජයාණන් වහන්සේට ද, සතර මාර්ග ඥාන බෝධියට ද, සතර ඵලඥාන බෝධියට ද සර්වඥතාඥාන බෝධියට ද, ශාන්ත නිර්වාණ ධාතු බෝධියට ද,

සුවඳ තෙලින් දල්වන ලද අඳුර නසන මේ ප්‍රදීපාලෝකයෙන්ද විදුලි පහන් ආලෝකයෙන් ද පූජා කරමි. පූජාවේවා. මේ සුගන්ධ ධූපයෙන් පූජා කරමි. පූජාවේවා. මේ සුවඳ මල් සමූහයෙන් පූජා කරමි පූජා වේවා. මේ විසිතුරු මල් දම් සමූහයෙන් පූජා කරමි පූජාවේවා. මේ ෂඩ් වර්ණ කොඩි සමූහයෙන් පූජා කරමි. පූජා වේවා. මේ ප්‍රණීත අෂ්ඨපාන ගිලන්පසෙන් පූජා කරමි පූජා වේවා. මේ ප්‍රණීත චතුමධුරයෙන් පූජා කරමි. පූජාවේවා. මේ දැහැත් බෙහෙත් ඖෂධයෙන් පූජා කරමි. පූජාවේවා. මේ සුවඳ පැන් අභිෂේකයෙන් පූජා කරමි. පූජාවේවා. මේ ශීලාදි ප්‍රතිපත්ති ධර්මයෙන් පූජා කරමි. පූජාවේවා.

මෙසේ බුද්ධ පූජා පැවැත්වීම ද බෝධි පූජා පැවැත්වීම ද, ඥාන පූජා පැවැත්වීම ද, ලොව පහළ වී වදාළා වූ අනන්ත අපරිමාණ වූ බුද්ධ, ප්‍රත්‍යේක බුද්ධ, අග්‍රශ්‍රාවක මහා ශ්‍රාවක මහ රහත් ආදි මහෝත්තමයාණන් වහන්සේලාගේ ශ්‍රේෂ්ඨ චාරිත්‍ර ශීලයකි. මම ද ඒ උතුම් චාරිත්‍ර ශීලය මෙසේ අනුගමනය කරමි.

මේ ප්‍රණීත පූජා වස්තු සමූහය ස්වල්ප මොහොතකින් අනිත්‍යත්වයට යන්නා සේ සියලු සංස්කාරයෝ අනිත්‍යයෝ ය. සියලු සංස්කාරයෝ දුක්ඛයෝ ය. සියලු ධර්මයෝ අනාත්මයෝය. මේ බුද්ධ පූජාමය බෝධි පූජාමය ඥාන පූජාමය වන්දනාමය ශීලමය ප්‍රතිපත්තිමය කුශලානිශංස ධර්මය බුදු පසේ බුදු මහරහතන් වහන්සේලා නිවී සැනසී පැමිණ වදාළා වූ පරම රමණීය වූ ශාන්ති ලක්ෂණ වූ නිර්වාණ අභය පුරයට සුවසේ පැමිණීම පිණිසම හේතුවේවා ! වාසනා වේවා !!

සාධු ! සාධු !! සාධු !!!

## සෙත් පැතීම

තුන් ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරහත් වූ සම්‍යක් සම්බුද්ධ සිද්ධාර්ථ ගෞතම ශාක්‍ය මුනීන්ද්‍ර සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේ සත් අසංඛ්‍ය කල්ප ලක්ෂයක් මුලුල්ලේ සිතින් බුදුබව පතමින් මනෝප්‍රණීධානය පිරූ බව ඒකාන්ත සත්‍යයි. ඒ සත්‍යානුභාව බලයෙන් ද, නවාසංඛ්‍යය කල්ප ලක්ෂයක් මුලුල්ලේ වචනයෙන් බුදුබව පතමින් වාග් ප්‍රණීධානය පිරූ බව ඒකාන්ත සත්‍යයි. ඒ සත්‍යානු භාව බලයෙන් ද, දීපංකර සර්වඥ පාද මූලයේ සිට සාරාසංඛ්‍යය කල්පලක්ෂයක් මුලුල්ලේ මහා ප්‍රණීධානය පිරූ බව ඒකාන්ත සත්‍යයි. ඒ සත්‍යානුභාව බලයෙන් ද, මෙයින් අවුරුදු දෙදහස් පන්සිය අනූහතකට පෙර බුද්ධ ගයා ශුද්ධ භූමියේදී විජය ශ්‍රී බෝධිරාජයාණන් අබියසදී සපරිවාර මාර පරාජය කොට ලොව්තුරා බුද්ධ රාජ්‍යයට පත් වූ බව ඒකාන්තයෙන් සත්‍යයි. ඒ සත්‍යානුභාව බලයෙන්ද, එම සර්වඥතා ඥානයේ ආනුභාව බලයෙන්ද, එම විජය ශ්‍රී බෝධි රාජයාණන්ගේ ආනුභාව බලයෙන්ද මෙතෙකින් අප විසින් රැස්කරන ලද බුද්ධ පූජාමය බෝධි පූජාමය ඥාන පූජාමය කුශලානිසංස ධර්ම බලයෙන් ද, මේ පින් රැස අනුමෝදන් වන දිව්‍යරාජ මණ්ඩලයේ ආශිර්වාද බලයෙන් ද,

අප සැම දෙනාට ඇත්තාවූ අසනීප අපල උපද්‍රව නවග්‍රහදෝෂ සතුරුකරදර මාරක බාධක අතුරු අන්තරා අණ විණ කොඩි විණ බන්ධන ඇස්වහ කටවහ අලාභ අයස නින්දා අපහාස දුක් පීඩා සියල්ල හිරු දුටු අඳුරු සේ විහත විද්වංශනය වී සර්වාරක්ෂාව සැලසේවා. තබන තබන පියවරක් පාසා ගන්න හෙලන හුස්මරැල්ලක් පාසා ගෙවෙන විනාඩියක් තත්පරයක් පාසා රත්නත්‍රය සතු අති උතුම්

සූවිසි මහාගුණයේ අසීමිත ආරක්ෂාව ලැබේවා. කුසල් අරමුණෙන් සමාධි සිතින් සුවසේ නින්ද යාවා සුවසේ අවදි වේවා. නපුරු සිහින නොපෙනේවා. දෙවියන්ගේ ප්‍රසාදය ලැබේවා. මනුෂ්‍යයන්ගේ ප්‍රසාදය ලැබේවා. දෙවියන්ගේ දැහැමි ආරක්‍ෂාව ලැබේවා.

රජුන්ගෙන්, සොරුන්ගෙන් සතුරන්ගෙන් ගින්නෙන් ජලයෙන් වස විසෙන් අවි ආයුධයෙන් මනුෂ්‍යයන්ගෙන් අමනුෂ්‍යයන්ගෙන් තිරිසන්ගත සතුන්ගෙන් සීතලෙන් උණුසුමෙන් බඩ ගින්නෙන් පිපාසයෙන් මැසි මදුරුවන්ගෙන් අව්වැසි සුළං විසකුරු සතුන්ගෙන් වා පිත් සෙම් තුන් දොසින් රාග දෝස මෝහාදි උපක්ලේශයන්ගෙන් උපපීළක උපච්ඡේදක අකුසල විපාක වාරයකින්වත් බියක් තැති ගැනීමක් අන්තරාවක් සන්ත්‍රාසයක් රෝමෝද්ගමනයක් ආපදාවක් හිංසාවක් පීඩාවක් ව්‍යසනයක් විපතක් සිහිනෙකින්වත් නොම වී සර්වාරක්ෂාව ලැබේවා.

කාය චිත්ත පීඩාදියක් නොවී කායික මානසික සැනසිල්ල වැඩේවා. ලාභ අලාභ, යස අයස, නින්දා ප්‍රශංසා, සැප දුක නම් වූ අටලෝ දහමින් කම්පා නොවීමේ චිත්ත බලය චිත්ත සතිය චිත්ත සමාධිය චිත්ත ධෛර්යය චිත්ත වසී භාවය චිත්ත ශක්තිය ද තව තවත් වැඩේවා.

ගුණ නුවණින් ධන ධාන්‍යයෙන් යස ඉසුරෙන් සැප සම්පතින් ආයු වර්ණ සැපබල ප්‍රඥාවෙන් ද, නිත්‍යශීල උපොසථ ශීල, සිව් බඹ විහරණ සතර සංග්‍රහ වස්තුවෙන් ද, ධර්ම ඥාණ භාවනා ඥාන ප්‍රතිපත්ති ඥාණයෙන් ද සමථ භාවනා විපස්සනා භාවනාවෙන් ද දශ පාරමිතාදි බෝසත් ගුණයෙන් ද පෙර පස වැඩෙන පුර සඳ මඬලක්සේ දිනෙන් දින දියුණුවට හේතු වාසනා වේවා.

සිතුමිණි රුවනකින් මෙන්ද කල්ප වෘක්ෂයකින් මෙන්ද භද්‍රඝටයකින් මෙන්ද පූර්ණ චන්ද්‍රයා මෙන්ද සිතූ පැතූ සම්‍යක් ප්‍රාර්ථනා සියල්ල පිරී ඉතිරී පැතිරී සශ්‍රීක වී මුදුන්පත් වේවා. විංශත් ශතවර්ෂාධික කාලයක් අතරක් නොහැර අපරාජිතව උතුම් ලෙස මෙලොව ජයග්‍රහණය පරලොව ජයග්‍රහණය ලබමින් නිවන් මග පාරමී පිරීමේ ශක්තිය බලය, ධෛය්‍ර්‍යය වීර්යය ආරක්ෂාව ආශිර්වාදය සතිය සමාධිය ඥානය ගුණය ඡන්දය චිත්තය වීර්යය විමංසාවද රත්නත්‍රයානුභාව බලයෙන් ලැබේවා.

සසර වසනාතුරු භවයක් පාසා ශ්‍රේෂ්ඨතම කල්‍යාණ මිත්‍ර ආශ්‍රය ද පාරමී පිරීමේ භාග්‍යය ද සම්මා දිට්ඨිය ද ජාති ජාතිත් ලැබේවා.

සිල්වත් ගුණවත් නැණවත් බෝසත් දෙමවුපියන් ද සහෝදර සහෝදරියන් ද දූ දරුවන් ද නෑදෑ හිත මිතුරන් ද සේවක සේවිකාදින් ද කැටුව සුව සේ පාරමී පුරා දුක්ඛය සමුදය නිරෝධය මාර්ගය යන චතුරාර්ය සත්‍ය ධර්මය එකම ආසනයකදී සුවසේ අවබෝධ වීමෙන් බුදු පසේ බුදු මහරහතන් වහන්සේලා නිවී සැනසී වදාළා වූ අජරාමර ශාන්ත ප්‍රණීත නිර්වාණ සම්පත්ති ප්‍රතිලාභය තෙක්ම රත්නත්‍රයේ අසීමිත ආරක්ෂාව සෙත ශාන්තිය සැලසේවා.

## සෙත් ගාථා

ජයෝ මුනින්දස්ස සුබෝධි මූලේ
අහෝසි මාරස්ස පරාජයෝ හි
උග්ඝෝසයුං බෝධි මණ්ඩේ පමෝදිතා
ජයං තදා නාග ගණා මහේසිනෝ
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

ජයෝ මුනින්දස්ස සුබෝධි මූලේ
අහෝසි මාරස්ස පරාජයෝ හි
උග්ඝෝසයුං බෝධි මණ්ඩේ පමෝදිතා
සුපණ්ණ සංඝාපි ජයං මහේසිනෝ
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

ජයෝ මුනින්දස්ස සුබෝධි මූලේ
අහෝසි මාරස්ස පරාජයෝ හි
උග්ඝෝසයුං බෝධි මණ්ඩේ පමෝදිතා
ජයං තදා දේව ගණා මහේසිනෝ
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

ජයෝ මුනින්දස්ස සුබෝධිමූලේ
අහෝසි මාරස්ස පරාජයෝ හි
උග්ඝෝසයුං බෝධි මණ්ඩේ පමෝදිතා
ජයං තදා බ්‍රහ්ම ගණාපි තාදිනෝ
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

සාධු ! සාධු !! සාධු !!!

# කරණීය මෙත්ත සූත්‍රය

කරණීය මත්ථ කුසලේන - යන්තං සන්තං පදං අභිසමෙච්ච
සක්කෝ උජූච සුජූ ච - සුවචෝ චස්ස මුදු අනතිමානී

සන්තුස්සකෝ ච සුභරෝච - අප්පකිච්චෝ ච සල්ලහුකවුත්ති
සන්තින්ද්‍රියෝ ද නිපකෝ ච - අප්පගබ්භෝ කුලේසු අනනුගිද්ධෝ

න ච බුද්ධං සමාචරේ - කිඤ්චියේන විඤ්ඤූ පරේ උපවදෙය්‍යුං
සුඛිනෝ වා ඛේමිනෝ හොන්තු - සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා

යේ කේචි පාණභූතත්ථි - තසාවා ථාවරා වා අනවසේසා
දීඝා වායේ මහන්තා වා මජ්ඣිමා රස්සකාණුක ථූලා

දිට්ඨා වා යේ ච අද්දිට්ඨා - යේච දූරේ වසන්ති අවිදූරේ
භූතා වා සම්භවේසී වා - සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා

නපරෝපරං නිකුබ්බේථ - නාතිමඤ්ඤේථ කත්ථචිනං කඤ්චි
බ්‍යාරෝසනා පටිඝ සඤ්ඤා - නාඤ්ඤ මඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය

මාතා යථා නියං පුත්තං - ආයුසා ඒකපුත්ත මනුරක්ඛේ
එවම්පි සබ්බ භූතේ සු - මානසං භාවයේ අපරිමාණං

මෙත්තඤ්ච සබ්බ ලෝකස්මිං - මානසං භාවයෙ අපරිමාණං
උද්ධං අධෝ ච තිරියඤ්ච - අසම්බාධං අවේරං අසපත්තං

තිට්ඨං චරං නිසින්නෝ වා - සයානෝ වා යාවතස්ස විගතමිද්ධෝ
එතං සතිං අධිට්ඨෙය්‍ය - බ්‍රහ්මමේතං විහාරං ඉධ මාහු

දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා - දස්සනේන සම්පන්නෝ
කාමේසු විනෙය්‍ය ගේධං - නහි ජාතු ගබ්භසෙය්‍යං පුනරේතීති.

ඒතේන සච්ච වජ්ජේන සොත්ථි මේ හෝතු සබ්බදා !! (තුන්වරක්)

සබ්බීතියෝ විවජ්ජන්තු - සබ්බ රෝගෝ විනස්සතු
මා මේ භවත්වන්තරායෝ - සුඛී දීඝායුකෝ භව

භවතු සබ්බ මංගලං - රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ බුද්ධානු භාවේන - සදා සොත්ථි භවන්තු මේ

භවතු සබ්බ මංගලං - රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ ධම්මානු භාවේන - සදා සොත්ථි භවන්තු මේ

භවතු සබ්බ මංගලං රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ සංඝානු භාවේන - සදා සොත්ථි භවන්තු මේ

නක්ඛත්ත යක්ඛ භූතානං - පාපග්ගහ නිවාරණා
පරිත්තස්සානු භාවේන - හන්තු තේසං උපද්දවේ

යංදුන්නිමිත්තං අවමංගලඤ්ච - යෝ චාමනාපෝ සකුණස්ස සද්දෝ
පාපග්ගහෝ දුස්සුපිනං අකන්තං - බුද්ධානු භාවේන විනාසමේන්තු

යංදුන්නිමිත්තං අවමංගලඤ්ච - යෝ චාමනාපෝ සකුණස්ස සද්දෝ
පාපග්ගහෝ දුස්සුපිනං අකන්තං - ධම්මානු භාවේන විනාසමේන්තු

යංදුන්නිමිත්තං අවමංගලඤ්ච - යෝ චාමනාපෝ සකුණස්ස සද්දෝ
පාපග්ගහෝ දුස්සුපිනං අකන්තං - සංඝානු භාවේන විනාසමේන්තු

දුක්ඛප්පත්තා ච නිද්දුක්ඛා - භයප්පත්තා ච නිබ්භයා
සෝකප්පත්තා ච නිස්සෝකා - හොන්තු සබ්බේපි පාණිනෝ

සබ්බේ බුද්ධා බලප්පත්තා - පච්චේකානඤ්ච යං බලං
අරහන්තානඤ් ච තේජේන - රක්ඛං බන්ධාමි සබ්බසෝ (තුන්වරක්)

ඉදං වෝ ඤාතීනං හෝතු - සුඛිතා හොන්තු ඤාතයෝ (තුන්වරක්)

එත්තාවතා ච අම්හේ හි - සම්භතං පුඤ්ඤ සම්පදං
සබ්බේ දේවා අනුමෝදන්තු - සබ්බ සම්පත්ති සිද්ධියා

ආකාසට්ඨා ච භුම්මට්ඨා - දේවා නාගා මහිද්ධිකා
පුඤ්ඤන්තං අනුමෝදිත්වා - චිරං රක්ඛන්තු සම්බුද්ධ සාසනං
පුඤ්ඤන්තං අනුමෝදිත්වා - චිරං රක්ඛන්තු සම්බුද්ධ දේසනං
පුඤ්ඤන්තං අනුමෝදිත්වා - චිරං රක්ඛන්තු සම්බුද්ධ සාවකං
පුඤ්ඤන්තං අනුමෝදිත්වා - චිරං රක්ඛන්තු තුවං සදා

ඉමිනා පුඤ්ඤ කම්මේන - මා මේ බාල සමාගමෝ
සතං සමාගමෝ හෝතු - යාව නිබ්බාන පත්තියා (තුන්වරක්)

ඉදං මේ පුඤ්ඤ කම්මං - ආසවක්ඛයා වහං හෝතු සබ්බ දුක්ඛා
පමුඤ්චතු (තුන්වරක්)

ඉමාය ධම්මානු ධම්ම පටිපත්තියා බුද්ධං පූජේමි
ඉමාය ධම්මානු ධම්ම පටිපත්තියා ධම්මං පූජේමි
ඉමාය ධම්මානු ධම්ම පටිපත්තියා සංඝං පූජේමි
අද්ධා ඉමාය පටිපත්තියා ජාති ජරා මරණම්හා පරිමුච්චිස්සාමි

කායෙන වාචා චිත්තේන - පමාදේන මයා කතං
අච්චයං ඛම මේ භන්තේ - භූරි පඤ්ඤ තථාගත

කායේන වාචා චිත්තේන - පමාදේන මයා කතං
අච්චයං ඛම මේ ධම්ම - සන්දිට්ඨික අකාලික

කායෙන වාචා චිත්තේන - පමාදේන මයා කතං
අච්චයං ඛම මේ සංඝ - පුඤ්ඤක් ඛෙත්තං අනුත්තර

සාධු ! සාධු !! සාධු !!!

## මෛත්‍රී ප්‍රාර්ථනා

යං පත්තං කුසලං තස්ස - ආනුභාවේන පාණිනො
සබ්බේ සද්ධම්ම රාජස්ස - ඤත්වා ධම්මං සුඛාවහං

පාපුණන්තු විසුද්ධාය - සුඛාය පටිපත්තියා
අසෝක මනුපායාසං - නිබ්බාන සුඛමුත්තමං

චිරං තිට්ඨතු සද්ධම්මෝ - ධම්මේ හොන්තු සගාරවා
සබ්බේපි සත්තා කාලේන - සම්මා දේවෝ පවස්සතු

යථා රක්ඛිංසු පොරාණා - සුරාජාණෝ තථේවිමං
රාජා රක්ඛතු ධම්මේන - අත්තනෝව පජං පජං

චිරං තිට්ඨතු ලෝකස්මිං - සම්මා සම්බුද්ධ සාසනං
තස්මිං සගාරවා නිච්චං - හොන්තු සබ්බේපි පාණිනො

සම්මා වස්සතු කාලේන - දෙවෝ ච ජගති පති
සද්ධම්ම නිරතෝ ලෝකං - ධම්මේණේව පසාසතු

දේවෝ වස්සතු කාලේන - සස්ස සම්පත්ති හෝතුච
පීතෝ භවතු ලෝකෝ ච - රාජා භවතු ධම්මිකෝ

සාධු ! සාධු !! සාධු !!!

## නවගුණ ශාන්තිය

අරහං බුදු ගුණෙන් මගේ - ඉරුගෙ අපල දුරු වේවා
ලෙඩ දුක් බිය නොවී කිසිත් - සැපත සතුට ලං වේවා

සම්මා සම්බුද්ධ තෙදින් - සඳුගෙ අපල දුරු වේවා
මාරක බාධක වැළකී - මගේ පැතුම් ඉටු වේවා

විජ්ජා චරණෝ බලයෙන් - අඟහරු දොස් ඉගි ලේවා
වස විස ගිනි සතුරු විපත් - මා වෙත ලං නොම වේවා

සුගතෝ බුදු ගුණෙන් මගේ - බුධගෙ අපල දුරු වේවා
ගුණ නුවණින් වැඩී සියලු - සැප සම්පත් ඉති රේවා

ලෝක විදූ තෙදින් මගේ - ගුරුගෙ දෝස දුරු වේවා
සතුට සමාදානය මට - නිරෝගි සුව වැඩි වේවා

අනුත්තරෝ බුදුගුණයෙන් - සිකුරු අපල දුරු වේවා
සිතුම්ණ වැනි රුවන් ගැබක - ආයුෂ මගෙ වැඩි වේවා

පුරිස දම්ම සාරථි බල - මහිමෙන් සැඩ සෙනසුරාගෙ
අකල විකල භූත දෝෂ - ගැටුම් වැටුම් හා කොඩිවින

දුරැර සියලු මෙකී දෝෂ - විලස සාදු ජය බෝරුක
ජින පන්ජරයක් වේවා සෙනසුරු දොස් දුරු වේවා

සත්වා බුදු ගුණෙන් මගේ - රාහු අපල දුරු වේවා
යක්ෂ ප්‍රේත වින බන්දන - දුරුවී සිරි සෙත දේවා

භගවා යන විදුරබියෙන් - කේතු අපල ඉගි ලේවා
මගේ කයට බසට සිතට - සැපත සතුට වේවා

මකර කුම්භ මිටුන තෙරුස - මාරක බිය දුරු වේවා
කැපි කෝටියක්ම දෝෂ මට - ජය මග එළි වේවා

සිංහ මේෂ ධනු තුන් රැස - බාධක බිය දුරු වේවා
තිසරණ සරණින් ජයසිරි - සුබ සෙත මට ලං වේවා

මීන කටක නුහුණු තෙරුස - සැමගහ දොස් දුරු වේවා
ජීව සිද්ධි බලය මගේ - බුදු සරණින් සුරු කේවා

වෘෂභ කන්‍ය තුලා තෙරුස - සැමගහ දොස දුරු වේවා
දම් සරණින් මගේ අපල - දුරුවී සිරි සෙත වේවා

රාහු කේතු රවි සඳු කුජ බුද ගුරු කිවි සහ සෙනසුරු
නීච පාප අපල මගේ සඟ සරණින් වේවා දුරු

තෙරුවන් ගුණ සුවඳ අමා ඔසුවෙන් මට සැප වේවා
මගේ ගෙදර අයට මට ද - ජයසිරි සෙත ලං වේවා

නව ග්‍රහ සහ භූත දෝෂ - සැම දුරු වී සැප වේවා
ජය බෝරුක මුණි පිටදුන් - මට ජය සේසත වේවා

ජය සිරිමා බෝ රජුගේ - දක්ෂිණ ශාඛා සෙව නේ
දීප දූප මල් සුවඳින් - ගිලන් පසින් පුද දෙමි නේ

දහස් දෙනා එක් රොක්වී - කරන මෙපින් මෙත් සිති නේ
මිය ගිය අය නෑ මිතුරන් - සැම දෙන පින් ලැබ ගන් නේ

(පැරණි පුස්කොළ පොතකිනි)

අනුන්ට කීමේදී මගේ යන තැන ඔබේ කියාද මට යන තැන ඔබට කියාද කිවයුතු වේ.

මුද්‍රණය :

සක්වා ප්‍රින්ටර්ස්
SAKVA PRINTERS
අංක 51/A, කුලරත්න පාර, අම්බලන්ගොඩ.
Tel / Fax : 091-2258756